# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1799/33 – 2013 මාර්තු 01 වැනි සිකුරාදා – 2013.03.01

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම් ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩම්වල විස්තර:

බදුල්ල දිස්ත්‍රික්කයේ, බදුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, රිල්පොල කෝරළයේ රඹුක්පොත ගමේ 80-එච් ග්ලේන්ඇල්පින් ග්‍රාම නිළධාරි කොට්ඨාසයේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අ.ග.පි 80 අතිරේඛ 54 හා අ.ග.පි. 37 අතිරේඛ 46 හා 2013.02.13 දිනැති මූලික පිඹුරුවල කැබලි අංක 686, 736 සහ 737 ලෙසින් නිරූපනය කරන ප්‍රමාණයෙන් හෙක්. 1.7185 වූ හපුගහපතන නැමති ඉඩම.

**කැබලි අංක 686**

උතුරට: කැබලි අංක 33 සහ අ.ග.පි. 37 (රඹුක්පොත); නැගෙනහිරට: අ.ග.පි 37 (රඹුක්පොත); දකුණට: අ.ග.පි. 37 (රඹුක්පොත) හා කැබලි අංක 33; බටහිරට: කැබලි අංක 33.

**කැබලි අංක 736**

උතුරට: අ.ග.පි. 80 (හංවැල්ල) කැබලි අංක 11 සහ 737; නැගෙනහිරට: කැබලි අංක 11 සහ 737; දකුණට: කැබලි අංක 737 සහ 11; බටහිරට: කැබලි අංක 11 සහ අ.ග.පි. 80 (හංවැල්ල).

**කැබලි අංක 737**

උතුරට: කැබලි අංක 736 සහ 11; නැගෙනහිරට: කැබලි අංක 11; දකුණට: කැබලි අංක 11 සහ 736; බටහිරට: කැබලි අංක 736

ඉහත සඳහන් ඉඩම්වලට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 2013 මාර්තු මස 08 වැනි දින පූ. භා. 10.00 ට බදුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුයි.

තවද, 2013 මාර්තු මස 05 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම් ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

ගාමිණී මහින්දපාල ජෝපියස්,
ප්‍රාදේශීය ලේකම්,
බදුල්ල.

මගේ අංකය: බදු/04/07/112.
2013 පෙබරවාරි මස 22 වැනි දින,
බදුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

03 – 717

## සංශෝධනයයි

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

යොමු අංකය: DIK/LAN/03/03.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තිය යටතේ නිකුත් කරන ලද අංක 1783/40 හා 2012.11.09 දිනැති ගැසට් නිවේදනය පහත සඳහන් ආකාරයට සංශෝධනය කරමි.

01. **කැබලි අංක** 13
ඉඩමේ නම: කලපුබොඩවත්ත; විස්තරය: විවෘත මුඩුබිම, තාවකාලික ගොඩනැගිල්ලකින් කොටසක් සහ පඩිපෙලක් ඇත; හිමිකම් කියන අය: දික්වැල්ල, බෙලිඅත්ත පාරේ වරි. අංක 5, නිව් ආර්ට්ස් ස්ටුඩියෝහි ඩබ්. පුංචිහේවා; ප්‍රමාණය: හෙක්. 0.0015.

02. **කැබලි අංක** 14
ඉඩමේ නම: කලපුබොඩවත්ත; විස්තරය: ගෙවත්ත, ස්ථිර ගොඩනැගිල්ලකින් කොටසක් සහ තාවකාලික ගොඩනැගිල්ලකින් කොටසක් ඇත; හිමිකම් කියන අය: දික්වැල්ල, බෙලිඅත්ත පාරේ නිව් ස්ටාර් ජුවලර්ස් හි එම්. එන්. සැමිසන්; ප්‍රමාණය: හෙක්. 0.0021.

03. **කැබලි අංක** 43
ඉඩමේ නම: තුන්දාගේවත්ත, කල්දේරම්වත්ත, වේල්ලවත්ත; විස්තරය: ගෙවත්ත, ස්ථිර ගොඩනැගිල්ලකින් කොටසක් ඇත; හිමිකම් කියන අය: දික්වැල්ල වත්තේගම ජදිංචි එම්. එල්. එස්. කුලරත්න; ප්‍රමාණය: හෙක්. 0.0006.

බී. එස්. රන්ජිත,
ප්‍රාදේශීය ලේකම්,
දික්වැල්ල.

2013.පෙබරවාරි මස 27 දින,
දික්වැල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දීය.

03 – 718

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.